## පොල් පර්යේෂණ මණ්ඩලය - 2014

පොල් පර්යේෂණ මණ්ඩලයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 43 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට පොල් පර්යේෂණ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

ප්‍රමිති අංක 07 අනුව සමාලෝචිත වර්ෂය අවසානයට පිරිවැය රු. 2,750,561 ක් වූ පුස්තකාල පොත් සහ වාර සඟරා ක්ෂය කිරීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තියක් හඳුන්වා දී නොතිබුණි.

**2.3 ලැබිය යුතු ගිණුම්**

විද්‍යුත් සඟරා මිලදී ගැනීම සඳහා විදේශීය ආයතනයකට 2009 හා 2010 වර්ෂවලදී ගෙවා තිබූ රු.1,729,881 ක අත්තිකාරම් මුදලක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිරවුල් කර නොතිබුණි.

**3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මූල්‍ය සමාලෝචනය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.70,491,247 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.40,702,143 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.29,789,104 ක එනම් සියයට 73 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ සමස්ත ආදායමින් සියයට 62 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ අතර සියයට 38 ක් රජයේ ප්‍රදාන ලෙස ලැබී තිබුණි.

(ආ) මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ ආදායම රු. 298,339,973 ක් වූ අතර එය සමස්ත මෙහෙයුම් වියදම වූ රු. 407,510,726 න් සියයට 73 ක් පමණක් ආවරණය කර ගැනීමට හැකිවී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පොල් ඵලදාව

සමාලෝචිත වර්ෂයේදී ජාන සම්පත් මධ්‍යස්ථාන 04 ක් හා පර්යේෂණ මධ්‍යස්ථාන 06 ක් මණ්ඩලය විසින් පවත්වාගෙන ගොස් තිබුණි. එම වතුවල ඵලදාව පිළිබඳ කරනු ලැබූ විග්‍රහාත්මක සමාලෝචනයේදී පහත කරුණු අනාවරණය විය.

| ජාන සම්පත් / පර්යේෂණ මධ්‍යස්ථානය | ඇස්තමේන්තුගත ඵලදාව (ගෙඩි) | | තථ්‍ය ඵලදාව (ගෙඩි) | | ඇස්තමේන්තුගත ඵලදාව හා තථ්‍ය ඵලදාව අතර විචලනය-2014 | | පසුගිය වර්ෂයට සාපේක්ෂව තථ්‍ය ඵලදාවේ විචලනය | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2014 | 2013 | 2014 | 2013 | ගෙඩි | ප්‍රතිශතය සියයට | ගෙඩි | ප්‍රතිශතය සියයට |
| බණ්ඩිරිප්පුව | 710,000 | 700,000 | 792,279 | 748,461 | 82,279 | 10 | 43,818 | **6** |
| පල්ලම | 465,000 | 544,000 | 630,840 | 346,817 | 165,840 | 26 | 284,023 | **82** |
| පොත්තුකුලම | 740,000 | 735,000 | 747,838 | 567,278 | 7,838 | 1 | 180,560 | **32** |
| අඹකැලේ | 1,290,000 | 1,300,000 | 1,424,155 | 739,425 | 134,155 | 9 | 684,730 | **93** |
| රත්මලාගාර | 665,000 | 650,000 | 676,144 | 502,270 | 11,144 | 2 | 173,874 | **35** |
| වල්පිට | 92,000 | 80,000 | 107,963 | 122,620 | 15,963 | 15 | -14,657 | **-12** |
| මාකඳුර | 490,000 | 400,000 | 428,920 | 438,208 | -61,080 | -14 | -9,288 | **-2** |
| මාදුරුඔය | 610,000 | 577,060 | 776,226 | 656,600 | 166,226 | 21 | 119,626 | **18** |
| දූන්කන්නාව | 40,500 | 32,328 | 51,248 | 53,007 | 10,748 | 21 | -1,759 | **-3** |
| මිද්දෙණිය | 50,000 | - | 83,050 | 53,457 | 33,050 | 40 | 29,593 | **55** |
| එකතුව | 5,152,500 | 5,018,388 | 5,718,663 | 4,228,143 | 566,163 | | 1,490,520 | |

(i) වල්පිට මධ්‍යස්ථානයේ පොල් ඵලදාව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී සියයට 12 කින් අඩු වී තිබුණු අතර, පොල් වගාව පැරණි වී තිබීම හා යටි වගාවට බාධා වන පැරණි පොල් වගාවේ ගස් රැසක් ඉවත් කිරීම මේ සඳහා හේතු වී තිබුණි. දැනට මෙම වගාවේ වයස අවුරුදු 66 ක් වන අතර, පොල් ගසක සාමාන්‍ය ආයු කාලය අවුරුදු 60 ක් වේ. පොල් පැල යටි වගාවක් ලෙස කිරීම අසාමාන්‍ය ලෙස ප්‍රමාද කර තිබුණ අතර, දැනට යටි වගාව අවුරුදු 1 ත් 3 ත් දක්වා වයස්ගත බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

(ii) මාකඳුර මධ්‍යස්ථානයේ සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ඵලදාව ඇස්තමේන්තුගත ඵලදාවට වඩා සියයට 14 කින් අඩු වී තිබුණු අතර, කරටි සිහින්වීම නිසා ගස් 500 ක පමණ අඩු ඵලදාවක් ලැබීමට හේතුවී තිබුණි. කෙසේ වුවද ප්‍රශ්නයට පිළියමක් ලෙස මෙම ගස් වෙනුවට "උස x මිටි දෙමුහුම් පොල්" වගාව ආරම්භ කර ඇත්තේ වසර 3 කට පෙර බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) අක්කරයක ඵලදාව හා ගසක වාර්ෂික සාමාන්‍ය ඵලදාව

සමාලෝචිත වර්ෂයේදී ජාන මධ්‍යස්ථාන 04 ක හා පර්යේෂණ මධ්‍යස්ථාන 06 ක අක්කරයක පොල් ඵලදාව සම්බන්ධයෙන් තොරතුරු පහත දැක්වේ.

| ජාන සම්පත් / පර්යේෂණ මධ්‍යස්ථානය | ඵල දරන වගාව සහිත භූමි ප්‍රමාණය (අක්කර) | ඵල දරන ගස් සංඛ්‍යාව | වැටුණු පොල් (ගෙඩි) | මුළු වාර්ෂික අස්වැන්න (ගෙඩි) | ගසක වාර්ෂික සාමාන්‍ය අස්වැන්න (ගෙඩි) | අක්කරයට ඵලදාව (ගෙඩි) | වැටුණු පොල් ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|
| බණ්ඩිරිප්පුව | 287 | 10,706 | 96,699 | 792,279 | 74 | 2,761 | 12 |
| පල්ලම | 499 | 14,246 | 54,907 | 630,840 | 44 | 1,264 | 9 |
| පොත්තුකුලම | 210 | 9,409 | 175,560 | 747,838 | 79 | 3,561 | 23 |
| අඹකැලේ | 329 | 16,917 | 287,802 | 1,424,155 | 84 | 4,329 | 20 |
| රත්මලාගාර | 226 | 10,598 | 108,679 | 676,144 | 64 | 2,992 | 16 |
| වල්පිට | 42 | 1,684 | 38,507 | 107,963 | 64 | 2,571 | 36 |
| මාකදුර | 126 | 4,200 | 111,082 | 428,920 | 102 | 3,404 | 26 |
| මාදුරුඔය | 195 | 7,546 | 241,976 | 776,226 | 103 | 3,981 | 31 |
| දුන්කන්නාව | 23 | 862 | 10,310 | 51,248 | 59 | 2,228 | 20 |
| මිද්දෙණිය | 72 | 1,281 | 1,240 | 83,050 | 65 | 1,153 | 1 |
| එකතුව | 2,008 | 77,449 | 1,126,762 | 5,718,663 | | | |

(i) අක්කරයකට සාමාන්‍ය පොල් ඵලදාව ගෙඩි දළ වශයෙන් 4,500 – 5,000 අතර විය යුතු වුවත් පර්යේෂණ ආයතනයේ සියළුම වතුවල පොල් ඵලදාව අවම මට්ටම වන පොල් ගෙඩි 4,500 කටත් වඩා අඩුවෙන් පැවතුණු අතර, පොල් පැල යටි වගාව ආරම්භ කිරීම ප්‍රමාදවීම මේ සඳහා හේතු වී තිබුණි.

(ii) මණ්ඩලය මගින් නඩත්තු කරන ලද ජාන සම්පත්/පර්යේෂණ මධ්‍යස්ථාන 6 ක වැටුන පොල්ගෙඩි ප්‍රතිශතය සියයට 20 සිට සියයට 36 දක්වා පැවති බැවින් ඵලදාව නිසි කලට ලබා ගැනිමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.

(ඇ) වතුවල ප්‍රගතිය විමර්ශනය කිරීම සඳහා වූ ජාලගත තොරතුරු පද්ධතිය මගින් සමාලෝචිත වර්ෂය සඳහා මුළු පොල් ඵලදාව හා ඵලදරන ගස් සංඛ්‍යාව සම්බන්ධයෙන් සැපයෙන තොරතුරු හා හස්ත (මැනුවල්) ක්‍රමය මගින් සැපයෙන තොරතුරු අතර සමානතාවයක් නොවීය. මණ්ඩලයට අයත් වතු 10 ක සහ ආදර්ශ ගොවිපලක සමාලෝචිත වර්ෂයේ පොල් ඵලදාව හස්ත (මැනුවල්) ක්‍රමයට අනුව 5,718,663 ක් වූ අතර ජාලගත තොරතුරු පද්ධතිය අනුව 5,742,359 ක් වීමෙන් පොල් ගෙඩි 35,605 ක වෙනසක් ද , ඵලදරන ගස් සංඛ්‍යාව හස්ත (මැනුවල්) ක්‍රමයට අනුව 77,449 ක් වූ අතර ජාලගත තොරතුරු පද්ධතිය අනුව 77,280 ක් වීමෙන් පොල් ගස් 3,531 ක වෙනසක්ද නිරීක්ෂණය විය. ඒ අනුව පොල් වතු අංශයේ දෛනික, සතිපතා, මාසික හා වාර්ෂික ප්‍රගතිය විධිමත් තොරතුරු පද්ධතියක් මගින් සමාලෝචනය කර ගැනීමේ අරමුණ ලඟාකර ගැනීමේ ගැටළුවක් ඇතිවිය හැකිව තිබුණි.

(ඈ) අධ්‍යයන කටයුතුවලින් අනතුරුව අනිවාර්ය සේවා කාලය සේවය නොකළ විදේශ ශිෂ්‍යත්වලාභීන් හත් දෙනෙකුගෙන් අයවිය යුතු රු. 15,825,789 ක මුදලක් අදාළ නිලධාරීන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ජාන සම්පත්/පර්යේෂණ මධ්‍යස්ථානවල පොල් මයිටා හානිය හේතු කොට ගෙන ප්‍රධාන වශයෙන් පොල් ගෙඩි කුඩාවීම, හැඩය වෙනස්වීම සහ ලපටි ඇට්ටි හැලීයාම සිදුවන අතර මීට පිළියම් වශයෙන්

පර්යේෂණ මණ්ඩලය අන්තර් නිර්දේශයන් ඉදිරිපත් කර තිබුණි. එසේම මෙම මයිටා මර්දනය කිරීමේ තිරසාර ජෛව විද්‍යාත්මක ක්‍රමයක් ලෙස විලෝපිත මයිටාව පර්යේෂණ මණ්ඩලය විසින් හඳුන්වා දී තිබුණි. ඒ අනුව පොල් පර්යේෂණ මණ්ඩලය මඟින් විලෝපිත මයිටා මධ්‍යස්ථාන තුනක් ආරම්භ කර පවත්වා ගෙන ගොස් තිබුණි. මයිටා හානිය පාලනය කිරීම සඳහා අන්තර් නිර්දේශයන් හා විලෝපිත මයිටා නමැති ජෛව විද්‍යාත්මක ක්‍රමවේදය ක්‍රියාත්මක වන තත්ත්වයක් යටතේ මණ්ඩලය මඟින් නඩත්තු කරන ආදර්ශ පොල් උයන් 10 ට අදාලව සමාලෝචිත වර්ෂයේදී මයිටා හානියට ලක් වූ කුඩා පොල් ප්‍රමාණය ගෙඩි 236,482 ක ඉහළ අගයක් වී තිබුණි.

(ඊ) දෙමුහුම් වර්ගවල බීජ පොල් නිෂ්පාදනය සඳහා වන වගාවක් පවතින ප්‍රදේශයක පිහිටි බිම් ප්‍රදේශයක අවශ්‍යතාවය මත කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ පූනරීන් ප්‍රදේශයෙන් ඉඩමක් හඳුනාගෙන තිබූ අතර උතුරු පළාතේ පොල් වගාව සංවර්ධනය කිරීම සඳහා ප්‍රදේශයට ගැලපෙන සුදුසු විවිධ පොල් ප්‍රභේද සහිත උසස් ආරයේ බීජ පොල් ලබා ගැනීමට බීජ පොල් උද්‍යානයක් ක්‍රියාත්මක කිරීම මෙහි අරමුණ විය. මෙම කරුණට අදාළව පොල් පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ වෙත පිටපතක්ද යොමු කරමින් වන සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල් විසින් කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් ඇමතූ 2012 අගෝස්තු 20 දිනැති ලිපිය අනුව මෙම ඉඩම මඩුවිල්නාඩු රක්ෂිතයේ පිහිටා ඇති බැවින් මෙම ඉඩම අදාළ කාර්යය සඳහා ලබාදිය නොහැකි බව දන්වා තිබුණි. එසේ තිබියදී සමාලෝචිත වර්ෂයේ ඉහත ව්‍යාපෘතිය සඳහා ට්‍රැක්ටර් සහ ගෘහ භාණ්ඩ මිලදී ගැනීම සඳහා මණ්ඩලය විසින් රු. 2,118,510 ක වියදමක් දරා තිබූ අතර එම ඉඩම එළි පෙහෙළි කිරීම සඳහා ශ්‍රී ලංකා යුධ හමුදාවට සහ ට්‍රැක්ටර් මිලට ගැනීම සඳහා බාහිර ආයතනවලට පිළිවෙලින් රු. 4,110,400 ක හා රු.1,460,140 ක් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි.

(උ) මණ්ඩලය විසින් භාවිතා කරන ගිණුම්කරණ මෘදුකාංගය තුළින් පරිගණකගත ගිණුම්කරණ මෘදුකාංගයක් භාවිතයෙන් අපේක්ෂා කරන අරමුණු ඉටුකර ගැනීමට නොහැකිව තිබූ අතර මුරපද භාවිතය, උපස්ථ (Back up) විධිමත්ව පවත්වා ගැනීම නිසි පරිදි සිදු නොවන බව නිරීක්ෂණය විය. මෘදුකාංගය භාවිතයෙන් දෛනිකව දත්ත ඇතුළත් කිරීමක් සිදු නොකරන අතර එම මෘදුකාංගයෙන් ලබා ගන්නා උපලේඛන ඒවා පිළියෙල කළ හෝ පරීක්ෂා කළ නිලධාරියෙක් විසින් සහතික කළ බවක් දක්නට නොතිබුණි.

**4.4 කාර්යමණ්ඩල පරිපාලනය**

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 391 ක් වූ අතර, තථ්‍ය සේවක සංඛ්‍යාව 296 ක් විය. මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා අදාළ වන ජ්‍යෙෂ්ඨ, තෘතීයික හා ද්විතීයික මට්ටමේ තනතුරු පිළිවෙලින් 09 ක්, 19 ක් හා 45 ක් වශයෙන් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 22 ක් පුරප්පාඩුව පැවතිණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

**5.1 අයවැය ලේඛනමය පාලනය**

සමාලෝචිත වර්ෂයේ අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අයිතම අටක අයවැයගත අගයන් සහ තථ්‍ය අගයන් අතර වෙනස රු. 255,818,371 ක් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොමැති බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) මානව සම්පත් කළමනාකරණය

(ඇ) භෝග සංරක්ෂණය